රුහුණ විශ්වවිද්‍යාලය

2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 2000 ස්ථලය
පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/නොවැම්බර්

GEO 21673 – ස්වභාවික පරිසරය හා සම්පත්

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න

කාලය : පැය 03

---

01. (i) තිරසාර සංවර්ධනය යනු කුමක්ද?

(ලකුණු 05)

(ii) ස්වභාවික සම්පත් තිරසර ලෙස භාවිත කිරීමේ කාලීන වැදගත්කම නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

02. ශ්‍රී ලංකාවේ නාගරික භූමි පරිහරණය ආශ්‍රිතව හඳුනාගත හැකි ජල දූෂණ ප්‍රභවයන් සහ එහි බලපෑම් සුදුසු නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

03. (i) ජෛව මංකොල්ලය (Bio-Piracy) යනු කුමක්ද?

(ලකුණු 05)

(ii) ජෛව මංකොල්ලය සංවර්ධනය වන රටවලට බලපෑම් කොට ඇති ආකාරය ශ්‍රී ලාංකීය අත්දැකීම් ඇසුරින් විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 10)

04. "යම් රටක ජාතික සංවර්ධනය කෙරෙහි ස්වභාවික උපද්‍රව තීරණාත්මක බලපෑමක් සිදු කෙරේ." ඉහත ප්‍රකාශය නිශ්චිත නිදසුන් සහිතව විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 15)

54

05. “නිසි කළමනාකරණ ප්‍රවේශයක් සහ දීර්ඝ කාලීන ජාතික ප්‍රතිපත්තියක් නොමැතිකම, ස්වභාවික සම්පත් සංරක්ෂණය සහ කළමනාකරණයේදී සංවර්ධනය වන රටවල් මුහුණ දෙන ප්‍රධාන අභියෝගයන් වේ”. ඉහත ප්‍රකාශය ශ්‍රී ලංකාව ආශ්‍රිත නිදසුන් සහිතව විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 15)

06. භූමිය මත මිනිසා විසින් ඇති කරනු ලබන පීඩනය හේතු කොට ගෙන පැන නැඟී ඇති පාරිසරික අභියෝග උචිත නිදසුන් දක්වමින් විමර්ශනය කරන්න.

(ලකුණු 15)

07. (i) ජනනය වන මූලාශ්‍රය පදනම් කර ගනිමින් අපද්‍රව්‍ය වර්ගීකරණය කරන්න.

(ලකුණු 03)

(ii) අපද්‍රව්‍ය කළමනාකරණ දුර්වලතා හේතු කොට ගෙන, මානව යහපැවැත්ම කෙරෙහි ඇතිවන බලපෑම් ශ්‍රී ලංකාව ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

@@@@@@@